අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் நாயகம் +94-081-2388195
Director General
E-mail : dgdaph@sltnet.lk

# සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
# கால்நடை உற்பத்தி சுகாதாரத் திணைக்களம்
# Department of Animal Production and Health

කාර්යාලය
அலுவலகம் +94 081-2388120
Office 184/189/337/462
Web : www. daph.gov.lk

මගේ අංකය
DAPH/AD/20/3/1

දිනය:
2020-11- 26

ප්‍රධාන ලේකම් (බස්නාහිර/මධ්‍යම/දකුණ/සබරගමුව/ඌව/උතුරු මැද/උතුර/නැගෙනහිර/වයඹ)

අධ්‍යක්ෂ (සත්ත්ව අභිජනන / පශු අණපනත් හා නීති / මානව සම්පත් සංවර්ධන/සත්ත්ව සෞඛ්‍ය /පශු පර්යේෂණ / සැලසුම් හා ආර්ථික )

අධ්‍යක්ෂ ජනරාල් (වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව / සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව)

නාගරික කොමසාරිස් (අනුරාධපුරය / ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ)

<u>ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ වාර්ෂික ස්ථාන මාරු - 2021</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ වෙත එවන ලද මගේ අංක DAPH/AD/20/3/1 හා 2020.08.24 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද ස්ථාන මාරු අයදුම්පත්, 2020.10.23 දින රැස් වූ ස්ථාන මාරු මණ්ඩලය විසින් සලකා බලන ලද අතර, එම මණ්ඩලය විසින් ස්ථාන මාරු කිරීම් වලට අදාළව ඉදිරිපත් කරන ලද නිර්දේශ පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක: SML/02/16/05 (Vol-IV) හා 2020.11.18 දිනැති ලිපිය මගින් අනුමත කර ඇත.

03. ඒ අනුව මේ සමඟ ඇති ඇමුණුම - 01 හි සඳහන් ඔබ පළාතට/අංශයට අනුයුක්ත නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් දැනුවත් කර, ස්ථාන මාරු ලබා ඇති නිලධාරීන් අදාළ සේවා ස්ථාන වෙත සේවයට වාර්තා කිරීමට හැකිවන සේ ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වීමට නියමිත දින සිට නිදහස් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

04. එසේම ඇමුණුම - 01 හි අදාළ නම් යටතේ ක්‍රියාත්මක වන දිනය විශේෂයෙන් සඳහන්ව ඇති ස්ථාන මාරුවීම් හැර අනිකුත් ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වන දිනය 2021.01.01 වේ.

05. ඇමුණුම - 01 හි සඳහන් තීරණ පිළිබඳ නිලධාරීන්ගේ අභියාචනා වෙතොත් එම අභියාචනා ආකෘති අංක IV අනුව සකස් කර, පළාත් බලධාරීන්ගේ/අංශ භාර අධ්‍යක්ෂකගේ නිර්දේශ ද සහිතව මෙම ලිපියේ සඳහන් දින සිට දින 14 ක් ඇතුළත එවීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි. අදාල අංක IV දරණ ආකෘතිය ස්ථාන මාරුවීම් සඳහා අයදුම් පත් කැඳවන ලද මගේ අංක DAPH/AD/20/3/1 හා 2020.08.24 දිනැති ලිපියේ 05 ඡේදයෙන් දන්වා ඇති පරිදි දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය වන www.daph.gov.lk මගින් බා ගත කළහැකි බව වැඩිදුරටත් දන්වමි. එසේම අභියාචනා තීරණ දැන්වීමෙන් අනතුරුව එකී තීරණ සම්බන්ධයෙන් අතෘප්තියට පත්වන නිලධාරීන්ට රාජ්‍ය සේවා කොමිෂන් සභා රෙගුලාසි 231 පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා (ආකෘති අංක V අනුව සකස් කර) කළහැකි බවද දන්වන්නේ නම් මැනවි.

06. 2020.12.14 දිනට පසුව ලැබෙන අභියාචනා සලකා නොබලන බවද යම් හෙයකින් අභියාචනා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෙත නිසි බලධාරීන් මඟින් ඉදිරිපත් කිරීමේදී ප්‍රමාද වන්නේ නම් පළාත් සභාවලට අනුයුක්ත නිලධාරීන්ගේ අභියාචනාවල ප්‍රගමන පිටපත් එවීම වැදගත් වන බවටද නිලධාරීන් දැනුවත් කරන්නේ නම් මැනවි.

වෛද්‍ය ආර්. හෙට්ටිආරච්චි

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

01. ලේකම්
පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත - කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය. — ඔබේ අංක: SML/02/16/05 (Vol-IV) හා 2020.11.18 දිනැති ලිපිය අනුව කා.දැ.ගැ.ස.

02. පළාත් අධ්‍යක්ෂ,
පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
(බස්නාහිර/මධ්‍යම/දකුණ/සබරගමුව/ඌව/උතුරු මැද/උතුර/නැගෙනහිර/වයඹ) - කරු. අ.ක.ස